# සමිඳාණන්ගේ ස්නාපන මංගල මහෝත්සවය

(2018 ජනවාරි මස 14 වන ඉරුදින)

01. ආරම්භක ප්‍රශංසාව :

"පූර්ණයාණෙනි ඔබ දකින තුරා...." පුබුදු ගී අංක 129 හෝ

"දෙව් රජය රජකරවන්න....." පුබුදු ගී අංක 238

02. **සුපුවත :**

හැඳින්වීම :

* ජේසුස් වහන්සේගේ ස්නාපන මංගල්‍යය අද අපි සමරනු ලබනවා. මෙම මංගල්‍යය පුබුදු ජනතාවගේ විශේෂ මංගල්‍යයක්.
* කිතු දන පුබුදුවේ කැරිස්මාවේ දෙවන අත්දැකීම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේව පුත්‍රභාවය දෙස බැලීමයි.
* ශු. සුවිශේෂක ගත් කර්තෘවරු හතර දෙනාම අප සමිඳාණන්ගේ බෞතිස්ම ස්නාපනය ගැන සඳහන් කරනවා.
* එලෙසම පෙරමග සුදානම් කළ ස්නාවක ජුවාම් තුමා ගැනද සුවිශේෂක වරුන් හතර දෙනාම සඳහන් කිරීමෙන් මෙම සිදුවීමේ වැදගත්කම අපට පැහැදිලි වෙනවා.

**පිවිසුම :**

* ශු.මාක් 1:4-6 කියවන්න.

* ජේසුස් වහන්සේගේ ස්නාපනය ගැන හරි හැටි තේරුම් ගැනීමට නම් අපි ස්නාවක ජුවාම් තුමාගේ භූමිකාව දෙසද හොඳ බැල්මක් හෙළිය යුතුයි.
* ශු.මාර්ක් 1:5 - ස්නාවක ජුවාම් තුමාගේ බව්තිස්ම පිළිවෙතට පාප උච්චාරණයද ඇතුළත්.
* එදා ජුදා සමාජයේ පාපොච්චාරණයේ අරමුණ වූයේ මේ දක්වා ගත කළ පව්කාර ජීවිතය සැබෑ ලෙසින්ම පසෙකලා නව මඟකට යෑමට නම් වෙනස් වූ ජීවිතයක් කරා යෑම ආරම්භ කිරීමයි.
* ජලයේ ගිල්වීමෙන් බව්තිස්ම ස්නාපනය ලැබීම සංකේතාත්මකයි. පරණ ජීවිතයට මරණය නව ජීවිතයකට ආරම්භය.
* ජලයේ ගිල්වීම මරණයේ සංකේතයක්.
* මේ අය ජෝර්දාන් නදියේ ගිල්වලා ස්නාපනය ලැබීම තුළින් සංකේතාත්මක වටිනාකමක් රැගෙන ආවා.
* ජෝර්දාන් නදියේ ගිල්වීම පිරිසිදු වීමක්, ජීවිතය පීඩාවට පත් කරන අපවිත්‍ර දෙයින් නිදහස ලැබීමක්.
* එය අළුත් ආරම්භයක් ; එහි අර්ථය මරණය සහ උත්ථානයයි. ජීවිතය නැවුම් ලෙස නැවත ආරම්භ කිරීමයි.
* ඒ අනුව මේ ජෝර්දාන් නදියේ ස්නාපනය ලැබූ ජනතාව ඒ තුළින් විශාල නැවුම් භාවයක්, අළුත් ජීවිතයකට ඇතුල් වීමක්.
  පරණ අතීතය මුළුමනින්ම සෝදා හැරීමක්. පව්කාර ජීවිතයෙන් අළුත් ජීවිතයකට පා තැබීමත් විශාල වශයෙන් බලාපොරොත්තු වුණා.
* ශු.මාක් 1: 3,9 කියවන්න.
* ජෙරුසලමේද, මුළු ජුදයේද පුරවැසියෝ ස්නාවක ජුවාම් තුමා වෙත පැමිණ බව්තිස්ම ස්නාපනය කරනු ලබූහ.
* 9 වන වගන්තියට අනුව අළුත් දෙයක් අපට දැකගත හැක. කුමක්ද? ජේසුස් වහන්සේ ගලීලයේ නාසරෙත්හි සිට වැඩම කර ස්නාවක ජුවාම් තුමාගෙන් ජෝර්දාන් ගඟේ ස්නාපනය ලබනවා.
* මෙහිදී අපට දැකගත හැකි වෙනවා ගලීලයේ සිට පැමිණි එකම වන්දනා කරුවා ජේසුස් වහන්සේයි. ඒ හැර ගලීලයේ සිට පැමිණි කිසිවෙකු ගැන සඳහන් නොවෙති.
* මෙහිදී පුදුම සහගත බව වනුයේ ජේසුස් වහන්සේ ගලීලයේ සිට එනම් භූගෝලීය වශයෙන් දුර බැහැර සිට පැමිණීමට වඩා ජේසුස් වහන්සේට බව්තිස්ම ස්නාපනය ලබන්නට උවමනා වීමයි.

* මෙය අපව විශ්මයට පත් කරවන අළුත්ම සිදුවීමකි. අප සියළු දෙනා තුළින් නිතැතින්ම අභ්‍යන්තරයේ ප්‍රශ්නයක් මතු වෙයි. කිසිම පාපයක් නොදත් ක්‍රිස්තුන් වහන්සේ ඇයි ජොර්දාන් නදියට බැස්සේ?
* ජොර්දාන් නදියේ රැඳී සිටි අනිත් පව්කරුවන් හා ඔවුන් වහන්සේ මිශ්‍ර (අනන්‍ය) වූයේ ඇයි?
* ජලයෙන් ස්නාපනය, පාප උච්චාරණය පව්කරුවන්ටයි. ජේසුස් වහන්සේ ඇයි මෙසේ කළේ?
* මේ පිළිබඳව ගැඹුරින් භාවනා කිරිමට අපි ශුද්ධවර ජොහාන් සුවිශේෂයට අවධානය යොමු කරමු.

කණ්ඩායම් සාකච්ඡාව - (හතර දෙනා බැගින්)

* ශු.ජොහාන් 1:1-34 කණ්ඩායම් තුළ කියවන්න.
  1:1-9, 29-34 විශේෂයෙන් අවධානය යොමු කරන්න.

* කුමක්ද මේ සිදුවනුයේ? ඇයි ක්‍රිස්තුන් වහන්සේ ජොර්දාන් නදියේ ස්නාපනය ලැබුවේ? ඔවුන් වහන්සේගේ අභ්‍යන්තර අත්දැකීම කුමක්ද? ක්‍රිස්තුන් වහන්සේ දෙස මොහොතක් නිශ්චලව නෙත් යොමන්න. ශුද්ධාත්මයාණන්ට අවදිවන්න. ඉඩ දෙන්න ක්‍රිස්තුන් වහන්සේගේ ඇතුලාන්තය ගැන ඔබට උගන්වන්නට.

* කණ්ඩායම් තුළ එකිනෙකා සමඟ ක්‍රිස්තුන් වහන්සේගේ අභ්‍යන්තර අත්දැකීම බෙදා ගන්න.

**ක්‍රිස්තුන් වහන්සේ දෙස බැලීම :**

"ඔබ දෙස මා...." (පුබුදු ගී අංක 366)

i ශු.මතෙව් 3:14-15 කියවන්න.

* අපි භාවනා කළ, සාකච්ඡා කළ, බෙදාගත් ප්‍රශ්නය ස්නාවක ජුවාම් තුමාටත් ඇති වන බව මෙයින් අපට පෙනී යනවා. 'ඔබෙන් බව්තිස්මය ලැබිය යුත්තේ මමය; එහෙත් ඔබ මා වෙත එන සේක්ද'යි ඇසීය. ජුවාම් තුමා ජේසුස් සමිඳාණන්ගෙන් ප්‍රශ්න කරන බව අපට පෙනේ.
* ජේසු සමිඳාණන්ගේ පිළිතුර කුමක්ද? "දැනට ඉඩ දෙන්න, මෙසේ දේව කැමැත්ත මුළුමනින්ම ඉටු කිරීම අපට සුදුසුය."
* මෙහි සඳහන් වන "දැනට" යන වචනයට අප අවධානය යොමන විට යම්කිසි කාලපරිච්ඡේදයක්, යම්කිසි සීමාවක් මේ තුළින් අඟවනවා. එසේ නැත්නම් තාවකාලික තත්ත්වයක් මේ තුළින් අඟවනවා.
* සමහරවිට මෙය අපගේ මනුෂ්‍ය බුද්ධියට අවබෝධ නොවන්නට හැකියි. අනිත් පැත්තෙන් දෙවියන් වහන්සේගේ කැමැත්තට පූර්ණව ආමෙන් නොකියන පරම්පරාවක් වෙනුවෙන්, එසේත් නැත්නම් සකල ජනතාව වෙනුවෙන්ම ජේසුස් වහන්සේ තාත්තාගේ කැමැත්තට ආමෙන් කියනවා.

* ශු.මතෙව් 3:15 වන පදය නැවත කියවන්න.
* " ජේසුස් වහන්සේගේ පිළිතුර වූයේ දැනට ඉඩ දෙන්න. මෙසේ දේව කැමැත්ත ඉටු කිරීම අපට සුදුසුය. "
* එසේ නම් ඇයි සමිඳාණන් වහන්සේ ජොර්දාන් නදියට බැස්සේ? අපට ඉතාමත් පැහැදිලියි ඔවුන් වහන්සේ දුන් පිළිතුර. දේව කැමැත්තට "ආමෙන් " කියන්නටයි.
* තවත් ගැඹුරු අන්දමට මෙනෙහි කරන විට මරණය සහ උත්ථානය ශුද්ධාත්මයාණන් වහන්සේ අපට උගන්වනවා. ක්‍රිස්තුන් වහන්සේ ජොර්දාන් නදියට බැසීම තුළ පව්කරුවන් සමඟ එකට මිශ්‍ර (අනන්‍ය) විම තුළ පාපයක් නොදත් ඔවුන් වහන්සේ පාපයක් වෙනවා. පව්කරුවෙකු වීම තුළින් ක්‍රිස්තුන් වහන්සේ අප සියළු දෙනා සමඟ එකමුතු වෙනවා. අප හා සහෝදරත්වයට පත් වෙනවා. එකට බැඳෙනවා.
* අපගේ ගැළවීම සඳහා පියාණන් වහන්සේ ඉදිරියේ පෙනී සිටිනවා.
* අපූරු සිදුවීමක් සමිඳාණන්ගේ ස්නාපනය තුළ සිදු වෙනවා. එම නිසා අපට සමිඳාණන්ගේ බව්තිස්ම ස්නාපන මංගල්‍යය ඉතාම වැදගත්.

* බව්තිස්මය ලබන ජනතාව පාපය උච්ඡාරණය කරමින් තම තමුන්ගේ පාපයේ බරෙන් නිදහස් වීමක් පතනවා. ජනතාව විශ්වාස කරනවා මේ පාපයෙන් මා දැන් නිදහස් වෙන බව.
* පාපයක් නොදත් ක්‍රිස්තුන් වහන්සේ ජෝර්දාන් නදියට බැසීම තුළ පාපයක් වෙනවා. සකල ලෝක වාසී මනුෂ්‍යයන්ගේ පව් ඔවුන් වහන්සේ තමන්ගේ කර පිටට බාර ගන්නවා. ඔවුන් වහන්සේ එය ජෝර්දාන් නදියේ පතුළටම දරා ගන්නවා.
* මුළු මිනිස් සංහතියේම පාපය උදෙසා මරණය කුරුසියේ මරණයට ආමෙන් කියනවා.
* අපි මොහොතක් ජේසු සමිඳාණන් වහන්සේට නමස්කාර කරමින් යාච්ඤා කරමු.

- 03 -

ii ශු.මාක් 1:10, ශු.මතෙව් 3:16 කියවන්න.

* කුමක්ද මෙම දේව වචනය අපට අනාවරණය කරන්නේ; ලොව කිසි විටෙක සිදු නොවු පුදුමාකර සිද්ධියක් සිදුවන ආකාරය අතී අලංකාරයි. සුවිශේෂක කතෘවරුන් සතර දෙනාම මෙම සිද්ධිය විස්තර කරනවා. එයින් අපට පෙනී යන්නේ මෙම සිදුවීමේ ඇති අති වැදගත් කමයි.
* ජේසුස් වහන්සේ ජලයෙන් ගොඩ එත්ම... අපට පෙනෙනවා ඔවුන් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ලබා ගත් ස්නාපනය ක්‍රිස්තුන් වහන්සේ පමණක් ලැබූ දෙයක්. ශු.මාක් තුමා (ශු.මාක් 1:10) මෙය විස්තර කරද්දී ඉතා ප්‍රවේසම් සහිතව එය ඉදිරිපත් කරන බව අපට පෙනී යනවා.
* ජේසු සමිඳාණන් ලබන ශුද්ධාත්ම ස්නාපනයට ස්නාවක ජුවාම් තුමාගේ කිසිම බලපෑමක් නැති බව පෙන්වා දෙනවා. ශුද්ධාත්ම ස්නාපනය සිදුවනුයේ ස්නාවක ජුවාම් තුමාගෙන් බව්තිස්ම ස්නාපනය ලබන අවස්ථාවේ නොවන බව පෙන්වා දෙනවා. එම නිසා ශු.මාක් තුමා සඳහන් කරන්නේ "ජේසුස් වහන්සේ දියෙන් ගොඩනැගෙත්ම " ඒ කියන්නේ වතුරෙන් ගොඩට ආවට පස්සේ.
* මතෙව් තුමාගේ සුවිශේෂයේ වාර්ථාවන්ට අනුව (ශු.මතෙව් 3:16) "ජේසුස් වහන්සේ බව්තිස්ම ස්නාපනය ලැබ, එකෙණෙහිම දියෙන් ගොඩට ආ සේක." ජේසුස් වහන්සේ බව්තිස්ම ස්නාපනය ලැබ" එයින් අදහස් කරන්නේ ජලයෙන් ස්නාපනය ලබා අවසන් වූ පසු ජලයේ ස්නාපනය අවසානයි. එකෙණෙහිම "දියෙන් ගොඩට ආ සේක" ඊට පසුව දෙවන සිදුවීම ක්‍රිස්තුන් වහන්සේ මත ශුද්ධාත්මයාණන් වහන්සේගේ මේ මහා වැඩම කිරීම සිදුවීම.

මෙහිදී සිදුවීම් දෙකක් අපි දකිනවා.

1. ජලයෙන් ස්නාපනය
2. ශුද්ධාත්මයාණන්ගෙන් ස්නාපනය

* සමිඳාණන්ගේ ජෝර්දාන් නදියේ බව්තිස්ම ස්නාපනය ලැබූ අත්දැකීම භාවනා කරද්දී ජලයෙන් බව්තිස්ම ස්නාපනය වගේම ශුද්ධාත්මයාණන්ගෙන් අප ලබන්නාවූ ස්නාපනය යන දෙකම ක්‍රිස්තියානි කතෝලික ජීවිතයට වැදගත් කියා අපිට ස්වාමි තාත්තා උගන්වලා ඇත.
* ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

i ජේසුස් වහන්සේ ලැබූ ස්නාපනයන් දෙක පිළිබඳව
ii එහි වෙනස්කම් මොනවාද?
iii ස්නාපන දෙකේම වැදගත්කම සාකච්ඡා කරන්න.

* **අපගේ පුත්‍රභාවය**

i ශු.මාක් 1:7-8 කියවන්න.

- ශු. සුවිශේෂක ගත් කර්තෘවරුන් හතර දෙනාම අපව ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ස්නාපනය කරන තැනැන් වහන්සේ ලෙස ජේසු සමිඳුණන්ව ඉදිරිපත් කරයි.
- අපි ශුද්ධාත්මයාණන් වහන්සේට බද්ධ වුනු ජීවිතයක් ගත කිරීමට කැඳවුමක් ලබා ඇත. ශුද්ධාත්මයාණන් වහන්සේට සමීප වුනු, ශුද්ධාත්මයාණන් වහන්සේට නිරන්තරයෙන් අවදිවන ජීවිතයක් ගත කිරීම අපගේ කැඳවීමයි.
- එවැනි ජීවිතයක් ගත කරන අපි නිරන්තරයෙන් සිහිපත් කළ යුතුයි, අපව ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ස්නාපනය කරන්නේ අප සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කියා.

- එබැවින් මේ ලැබූ නව වසරේ අපව නැවත නැවතත් ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ස්නාපනය කරන්නට යැයි අපි සමිඳාණන් වහන්සේගෙන් ඉල්ලමු.

ii - මේ කාලපරිච්ඡේදය තුළ කිතු දන පුබුදු ජනතාවට අප සමිඳාණන් වහන්සේගේ සුවිශේෂ දූත කාර්යයක් බාර දී තිබෙනවා.
- ජේසු සමිඳාණන් දෙස බලද්දී ජෝර්දාන් නදියේ ස්නාපනය සමග සමිඳාණන් වහන්සේට පැවරුනු දූත මෙහෙවර ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරුණු දූත කාර්යයක් බව සුවිශේෂ ගත් කර්තෘවරු 4 දෙනාම වාර්ථා කරනු ලබනවා.
- අපගේ පුබුදු ගමනේ පනස්වෙනි වසර රන් ජුබිලියට දැනට මේ වසරේ සිට බලන විට තව වසර තුනකුයි තිබෙන්නේ. ඒ සඳහා සූදානම් වන මෙම කාලය පුරා අප දැනටමත් ආරම්භ කර තිබෙන "ශුද්ධවූ ජුසේ වාස් මෙහෙවර" ඵලදරනු සඳහා, ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරුණු දූත මෙහෙවරක් වනු සඳහා අපි අධිෂ්ඨාන කරගත යුතුයි. අපි දිනපතා යාච්ඤා කරමින් වරප්‍රසාදයෙන් පිරිලා මේ සඳහා පියවර ගනිමු.
- අපි පුබුදු ජනතාව ගැන බොහෝ සෙයින් ප්‍රසන්න වෙනවා. බොහෝ ශ්‍රාවක සංඝ ඉතාම උනන්දුවෙන් ක්‍රියා කරන බව අපි දකිනවා. එම ජනතාව තුළ ශුද්ධාත්ම ගින්න ඇවිලෙන ආකාරය අපි දකිනවා. දුර බැහැර ඈත ප්‍රදේශ කරා යමින් මේ මහා මෙහෙවරෙහි නියැලෙනවා.
- එමනිසා මේ ඉදිරි වසර තුන අපි ශුද්ධාත්ම බව්තිස්මයෙන් පන්නරය ලබා අපට ලැබී තිබෙන ශුද්ධවර ජුසේ වාස් මෙහෙවර ශුද්ධාත්මයාණන්ගෙන් බලයෙන් පිරුණු දූත මෙහෙවරක් කර ගැනීමට, එදා ශුද්ධවූ ජුසේ වාස් පියතුමා ලංකාවේ උතුර - දකුණ, නැගෙනහිර - බටහිර, කඳුරට මුළු දේශයේ සෑම ගමකට, නගරයකට අතී දිළිඳුව දේව සංරක්ෂණය කෙරෙහි විශ්වාස කරමින් ගමන් කළා සේ අපද සිරිලක දස දෙස ශුද්ධවර මෙහෙවරේ යෙදෙමු.
- ශුද්ධවූ ජුසේ වාස් මුනිතුමා මෙන් අපගේ සමිඳාණන්ව අපගේ දේශයට තව තවත් හඳුන්වා දෙමු. පළමු පියවර ලෙස සභාව අතහැර දා ගිය අය වෙතට ගමන් කරමු.

සාකච්ඡාව : (ශ්‍රාවක සංඝ හැටියට වෙන් වී සාකච්ඡා කරන්න)

* ඔබගේ ශ්‍රාවක සංඝය තුළ, සාංඝිකය තුළ ශුද්ධවර ජුසේ වාස් මෙහෙවර ආරම්භ කර තිබේද? එහි ප්‍රගතිය කුමක්ද?
* ආරම්භ කර නැත්නම් අපට ගතහැකි පියවරවල් ගැන කථා කරමු. අපි කොහේටද යන්නේ? කවදාද පටන් ගන්නේ?
* ශ්‍රාවක සංඝ හැටියට ගතහැකි පියවර කුමක්ද?

"බාධක පීඩා...." (පුබුදු ගී අංක 113)

- දිවා විවේකය -

**03. මනස්ථාපනයේ මෙහෙය :**

සමිඳාණන්ගෙන් අපට ලැබී තිබෙන තව බලගතු වචනයක් "මනස්ථාපනය" පසුගිය ශුද්ධාත්ම මංගල මහෝත්සවයේ සිට වසර 4ක් මනස්ථාපනයේ කාලයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුවා.
- දැන් 2018 වසර සමග එය වසර තුනක් බවට පත් වුනා. ඉදිරි වසර තුන පුරාම අපි මනස්ථාපනයේ යතුර අපගේ දකුණතේ තබා ගන්නට අමතක නොකළ යුතුය.
- ක්‍රිස්තුන් වහන්සේ දෙස නෙත් යොමද්දී ජෝර්දාන් නදියේ බව්තිස්ම ස්නාපනයෙන් පස්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් වහන්සේව රැගෙන ගියේ පාළුකරයට. පාළුකරයේදී යක්ෂයා සමග සටන් කරන්නට, යක්ෂයාගේ බලය බිඳින්නට ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේට ඉගැන්නුවා. සමිඳාණන් වහන්සේ ඉතාමත්ම බැහැපත්ව ශුද්ධාත්මයාණන්ගේ මෙහෙයවීමට යට වෙනවා, කීකරු වෙනවා. ඔවුන් වහන්සේ පාළුකරයෙන් ආ විගස කළ පළමු දේශනය කුමක්ද?

- "මනස්ථාපනය වන්න; මක්නිසාද ස්වර්ග රාජ්‍යය ආසන්නය"
- අපට ස්වර්ග රාජ්‍යයට ඇතුළු වීමට නම් නිරතුරුව මනස්ථාපනයේ හදවතක් අප තුළ තිබිය යුතුය.
- අපි හැමදෙනාම පෞද්ගලිකව අප එකිනෙකා තම තමාගේ ජීවිතය දෙස බැලිය යුතුයි. ශුද්ධාත්මයාණන්ගේ බලය නැතිව මෙය කළ නොහැකිය. ඒ නිසා නිරන්තරයෙන් ශුද්ධත්මයාණන් වහන්සේට අවදි වෙමින් නිරන්තරයෙන් මනස්ථාපනයේ ජීවිතයකට ඇතුළු වෙන්නට අවශ්‍යයය.
- අපි මනස්ථාපනය වුනේ නැත්නම් අපට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වෙන්නට බැහැ. ක්‍රිස්තුන් වහන්සේ අප සමඟ ඉන්න බව අපට පෙනෙන්නේ නැහැ.
- බලන්න, ක්‍රිස්තුන් වහන්සේ පාපය නොදත් ක්‍රිස්තුන් වහන්සේ පාපයක් වෙලා ජෝර්දාන් නදියට බැස්ස මොහොතේ පියාණන් වහන්සේ ඔවුන් වහන්සේට ස්වර්ග රාජ්‍යය විවෘත කළා.
- අපත් දෙවියන් වහන්සේගේ වචනයට කීකරු වන සෑම අවස්ථාවකදීම ස්වර්ග රාජ්‍යය විවෘත වෙනවා.
- අපට ස්වර්ග රාජ්‍යය ක්‍රිස්තුන් වහන්සේයි. ක්‍රිස්තුන් වහන්සේ අපට ළං වෙනවා.
- එම නිසා අපි මනස්ථාපනයේ වැදගත්කම අමතක නොකළ යුතුයි.

  * පළමුව මම මගේ ජීවිතය දෙස හැරී බලන කාලයක්.
  * පවුලක් හැටියට මා මගේ ස්වාමි පුරුෂයා, බිරිඳ, දරුවන් සමඟ අපගේ ජීවිත රටාව දෙස හැරී බලන කාලයක් කර ගනිමු.
  * මහ පුබුදු සංඝයක් හැටියට, අපගේ ජීවිත රටාව සුබැඳි - සබැඳි සංඝයක් හැටියට අපි අපගේ ජීවිත රටාව දෙස හැරී බලමු.

- අපි නිරන්තර මනස්ථාපනයකට ඇතුළු වෙමු. "මෙටනොයියා" කියන වචනයේ තේරුම මනස හරි තැනට රැගෙන ඒමයි. මනස ස්ථාපනය කිරීමයි.
- එමනිසා අපි වැරදි මාර්ගවල ගමන් කරලා තියෙනවා නම් ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කල පාපය කුමක්දැයි අපට පෙන්වා දෙන සේක. ඔවුන් වහන්සේ අපගේ වැරදි මාර්ග අපට පෙන්වා දෙන සේක. අපි බැහැපත්ව අපගේ වැරදි මාර්ගවලින් හැරී ශුද්ධාත්මයාණන් වහන්සේ අපට පෙන්වන මාර්ගයට හැරෙන්නට ඕනේ. මාර්ගය ජේසු ක්‍රිස්තුන් වහන්සේයි.
- ක්‍රිස්තුන් වහන්සේ වදාළේ "මාර්ගයද, සත්‍යයද, ජීවනයද මමය" කියාය.
  එමනිසා මාර්ගයද, සත්‍යයද, ජීවනය වූ ක්‍රිස්තුන් වහන්සේ හා බැඳුනු ජීවිතයකට, සම්බන්ධ ජීවිතයකට ඇතුළු වීමට අධිෂ්ඨානයක් ඇති කර ගනිමු.
- සමිඳාණන්ගේ ස්නාපන මංගල්‍යය තුළින් ඔවුන් වහන්සේ අපට රැගෙන ආවාවූ ගැළවීමදායක ප්‍රේමය, පව් කමාව මනස්ථාපනයේ ජීවිතයකට ඇතුළු වීමට අපව කැඳවයි. අපි මනස්ථාපනයට පිපාසයක් ඇති කර ගනිමු.

* **මනස්ථාපනයේ මෙහෙයකට ඇතුළු කරන්න.**

- ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වී ඔබගේ පාපය පෙන්වා දෙන්නට ඉඩ දෙන්න.
  පුබුදු ගී අංක 231 "ශුද්ධාත්මයාණෙනි වඩින්න මා හදවත පුරා..."
- අපගේ ජීවිතවල දෙබිඩි ස්වභාවය, අප යට වී ඇති මුල් අගුණ පව්, අපගේ පුරුදු, වහල්කම්, ඇබ්බැහිවීම් වලට අවංකව අවදි වී, හඳුනා ගන්න.
- පසුතැවිලිවීමේ යාච්ඤාවකට ඇතුළු වන්න.
- ගී අංක 227 "හැරෙනා පිණිස..." ගයමින් හැරෙන්න, කුරුස පාමුලට යන්න. සමිඳුන්ගේ ශ්‍රී රුධිරයේ පවිත්‍රතාවය අත්දකිමින් යාච්ඤා කරන්න.
- පුබුදු ගී අංක 34 "සමා වුව මැන සමිඳුනේ...." උදව් කර ගන්න.
- අවසානයේ ගැළවීම, නිදහස අයිති කරගෙන ප්‍රශංසා කරන්න.
  පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ...."

04. **ශුද්ධාත්ම ස්නාපන මෙහෙය**

- ජෝර්දාන් නදී තෙර ජේසු සමිඳාණන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කළේ පරවියෙකුගේ රූපාකාරයෙනි. ශුද්ධවූ බයිබලය අපට විවිධ සංඛේත මගින් කථා කරනවා.
- සංඛේත භාෂාවෙන් පරවියා යනු අළුත් මැවිල්ලක,අළුත් යුගයක ආරම්යක්.
- ක්‍රිස්තුන් වහන්සේ ජෝර්දාන් නදියට බැස ගිය ගමන ඉතාම නැවුම් නව යුගයක ආරම්භය වුනා. මුළු මිනිස් සංහතියම අළුත් වුනා.
- මේ ස්නාපන මංගල්‍යයේදී අපිත් අළුත් යුගයකට පා තබන්නට ඕනේ.
- මුළු මහ පුබුදුවටම අළුත් යුගයක් උදාකර ගන්න කියා අපි යාච්ඤා කරමු. අප වෙත අළුතෙන් ශුද්ධාමයාණන් වගුරුවන්න කියා යාච්ඤා කරමු.
- පෙන්තකෝස්ත දවසේදී අපට ශුද්ධාත්මයාණන් වහන්සේව වගුරුවලා අවසන්. එහෙත් අප නැවත නැවත මේ ඉල්ලීම කරද්දී අපට දෙන්න, අපට දෙන්න යයි අයදින විට, අපගේ පළමු වැගිරීම අපගේ ජීවිතයට අළුත් බවක්, නැවුම් භාවයක් ගෙන එනවා. අපි මිනිසුන් හැටියට දුර්වල නිසා මනුෂ්‍ය බුද්ධියෙන් දැනුවත්වම, උවමනාවෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වෙන්නට පටන් ගන්නවා.
- අපිට ලැබුනු තව බලගතු වචනයක්.

  "දිළිඳු වූ ඔබ භාග්‍යවන්තය" කැමැත්තෙන් දිළිඳු වීමට අපට බලය දෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය.

  " එමෙන්ම මා නිසා ඔබට නින්දා පීඩා කොට, නානා විධ අසත්‍ය චෝදනා නඟන කල ඔබ භාග්‍යවන්තයෝය. ප්‍රීති ප්‍රමෝද වන්න. මන්ද ස්වර්ගයේ ඔබේ ඵල විපාක ඉමහත් පවන්නේය. ඔබට පෙර සිටි දිවැසිවරයන්ටත් ඔවුහු එලෙසම පීඩා කළහ." (ශු.මතෙව් 5:12)

- දිවැසිවරුන්ට පමණක් නොව ක්‍රිස්තුන් වහන්සේට ද පීඩා කළා නම්, අපිත් ප්‍රීතියෙන් ඊට මුහුණ දෙමින් ගමන් කළ යුතු වෙයි. ඒ සඳහා අපි ශුද්ධාත්ම ස්නාපනයක් ඉල්ලමු.

- බාධක පීඩා මැද නොසැලී අප්‍රතිහත ධෛර්යෙන් යුතුව උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සාක්ෂිකරුවන් විමට ශුද්ධාත්ම ස්නාපනයක් පතා අයදිමු. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ගින්න අප එකිනෙකා තුළ අවුලවන්න කියා යාච්ඤා කරමු.

*** ස්නාපන මෙහෙය**

"ආ එනු මැනේ....." (පුබුදු ගී අංක 03)

- කුඩා කණ්ඩායම් තුළ එකිනෙකාට අත තබා, ස්නාපනය පතා යාච්ඤා කරන්න.

- පුබුදු ගී අංක 223 සමඟ ගැඹුරු ප්‍රශංසාවකට ඇතුළු වෙමින්, ශුද්ධාත්ම දීමනා අත්දකින යාච්ඤාවකට යන්න.

අවසාන ගිය - පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරවු....."

*************************